LIRNEasia
Pro-poor. Pro-market.

**13.10.2023**

**මුලින් ප්‍රකාශයට පත් කරන ලද්දේ 22.09.2023**

<u>ඔන්ලයින් ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකාවේ නව පනත් කෙටුම්පත සිංගප්පූරුවේ නීති සමඟ සැසඳීම</u>

ඔන්ලයින් ආරක්ෂාව පිළිබඳ නව පනත් කෙටුම්පතක් සැප්තැම්බර් 15 දින ගැසට් මගින් පළ කරන ලදි. (ප්‍රසිද්ධ කරනු ලැබුවේ සැප්තැම්බර් 19 වැනි දිනය.) ප්‍රකාශ කර ඇති පරිදි, පනත් කෙටුම්පතේ අරමුණු වන්නේ 'මාර්ගගත ආරක්ෂණ කොමිසමක් පිහිටුවීම; ශ්‍රී ලංකාව තුළ ඇතැම් ප්‍රකාශ මාර්ගගත සන්නිවේදනය තහනම් කිරීමට ප්‍රතිපාදන සම්පාදනය කිරීම; තහනම් අරමුණු සඳහා මාර්ගගත ගිනුම් සහ ව්‍යාජ මාර්ගගත ගිනුම් භාවිතය වැළැක්වීම; ශ්‍රී ලංකාව තුළ තහනම් අරමුණු සඳහා භාවිත කරන මාර්ගගත ස්ථාන හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට විධිවිධාන සැලැස්වීම; සහ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය සඳහා මුදල් සැපයීම සහ අනෙකුත් ආධාර මැඩපැවැත්වීම' වේ.

නව පනත් කෙටුම්පතේ බොහෝ විධිවිධාන සිංගප්පූරුවේ ඔන්ලයින් ව්‍යාජත්ව හා හැසිරවීමේ පනත (POFMA) ආදර්ශයට ගෙන සම්පාදනය කර ඇති බව පෙනේ. කෙසේ වෙතත්, සැලකිය යුතු වෙනස්කම් ද තිබේ. ලේඛන දෙකේ මූලික කියවීමක් මත පදනම්ව, පහත දැක්වෙන කොටස්වල වෙනස්කම් කිහිපයක් මෙහි හුවා දක්වනු ලැබේ. මෙය (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්) නීතිය අර්ථකථනය කර බලාත්මක කරන්නේ කෙසේද යන්න හෝ (සිංගප්පූරුව සම්බන්ධයෙන්) නීතිය අර්ථකථනය කර බලාත්මක කරමින් සිටින්නේ කෙසේද යන්න පිළිබඳ විශ්ලේෂණයක් නොවේ.

ක්‍රියාත්මක වෙනත් නීති යටතේ දැනටමත් පාලනය කළ හැකි ක්‍රියාවන් ද මෙම නීතිය මගින් ආවරණය කළ හැකි අවස්ථා ද අපි පෙන්වා දෙන්නෙමු. යෝජිත නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව මෙන්ම මානව හිමිකම් පරාසයකටම එමගින් ඇතිවන බලපෑම ඇතුළු එහි ඇති අවදානම් පිළිබඳව පාර්ශ්වකරුවන්ට අදහස් සැපයිය හැකි වන පරිදි මහජන අදහස් ප්‍රකාශ කිරීමේ කාලසීමාවක් ලබාදෙන්නැයි අපි ඉල්ලා සිටිමු.

<u>වැරදි පරාසය</u>

සිංගප්පූරු පනත යටතේ වැරදි කේන්ද්‍රගත වී ඇත්තේ 'අසත්‍ය ප්‍රකාශන සන්නිවේදනය' තහනම් කිරීම වටා ය. ශ්‍රී ලංකා පනත් කෙටුම්පත ද ඒ හා සමානව 'අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය' තහනම් කිරීම මත කේන්ද්‍රගත වේ. උදාහරණයක් ලෙස 12 වැනි වගන්තිය පවසන්නේ, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් ඇති කරවන හෝ විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය කරන ඕනෑම පුද්ගලයෙක් විවිධ තරාතිරම්වල මිනිසුන් අතර අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් වරදක් සිදු කරයි..'

මෙම විධිවිධානය සිංගප්පූරු පනතේ 7 (1) (ආ) වගන්තියට සමාන වේ. එම වගන්තිය පහත දැක්වේ:

'එය සත්‍ය අසත්‍ය ප්‍රකාශයක් බව ද, සිංගප්පූරුවේදී එම ප්‍රකාශය සන්නිවේදනය කිරීම මගින් (i) සිංගප්පූරුව තුළ හෝ සිංගප්පූරුවේ ඕනෑම ප්‍රදේශයක ආරක්ෂාවට අගතියක් විය හැකි බව (ii) මහජන සෞඛ්‍යයට, මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ මහජන මුදල්වලට අගතියක් විය හැකි බව (v) සතුරු හැඟීම් අවුළුවන, විවිධ පුද්ගලයන් කණ්ඩායම් අතර වෛරය හෝ එදිරිවාදීත්වය ඇති කරන බව ද දැනුවත්ව හෝ එසේ විශ්වාස කිරීමට හේතු සහිතව සිංගප්පූරුව තුළ ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම සඳහා පුද්ගලයෙකු සිංගප්පූරුවේදී හෝ ඉන් පිටතදී කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය.'

කෙසේ වෙතත්, සිංගප්පූරු පනතේ මෙන් නොව, ශ්‍රී ලංකා පනත් කෙටුම්පතට ආගමට සම්බන්ධ වැරදි යනුවෙන් උප කුලකයක් ද ඇතුළත් වේ. උදාහරණ: ලෙස, '...අසත්‍ය ප්‍රකාශයකින් ආගමික රැස්වීමකට බාධා කිරීම' (15 වැනි වගන්තිය), සහ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත චේතනාවෙන් ඉලක්කගත තැනැත්තකු වෙත අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම' (16 වගන්තිය).

අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ අසත්‍ය ප්‍රකාශ සම්බන්ධ විධිවිධාන ද එහි අඩංගු වේ (13 වැනි වගන්තිය): අසත්‍ය ප්‍රකාශ '... ප්‍රකෝප කරවීමෙන් කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි' (14 වැනි වගන්තිය), වංචා කිරීම (18 සහ 19 වගන්ති) සාමය උල්ලංඝනය කිරීමේ චේතනාවෙන් යුත් අසත්‍ය ප්‍රකාශ පිළිබඳ (20 වගන්තිය) විධිවිධාන ද ඇත. 21 වැනි වගන්තිය ද වැදගත් වේ. 'ශ්‍රී ලංකා නාවික හමුදාවේ, යුද්ධ හමුදාවේ හෝ ගුවන්හමුදාවේ යම් නිලධරයකු, නාවිකයකු, සෙබළකු හෝ ගුවන් නැවියකු කැරලි ගැස්වීමේ චේතනාවෙන් හෝ මහජනයා අතර බියක් හෝ තැතිගැන්මක් ඇති කරවීමේ චේතනාවෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය' එමගින් තහනම් කරනු ලැබේ.

ශ්‍රී ලංකා පනත් කෙටුම්පතෙහි ආවරණය වන වැරදි පරාසය පුළුල් වන අතර සිංගප්පූරු පනතේ විෂය පථයෙන් ඔබ්බට විහිදෙයි. සයිබර් ආරක්‍ෂාව සම්බන්ධයෙන්, 'පෞද්ගලික තොරතුරු' (22 වැනි වගන්තිය) ප්‍රකාශයට පත් කිරීමෙන් තවත් පුද්ගලයෙකුට හිරිහැර කිරීමේ අරමුණින්, අසත්‍ය ප්‍රකාශය සන්නිවේදනය කිරීම තහනම් කිරීමේ විධිවිධාන ශ්‍රී ලංකා පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇත. ''පෞද්ගලික තොරතුරු'' යන්නෙන් අදහස් වන්නේ 'යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි යම් ඡායාරූපයක්, හඬ පටයක හෝ වීඩියෝ පටයක විස්තර ඇතුළු පුද්ගලික තොරතුරු' වේ.

**<u>අර්ථ නිරූපණ</u>**

එක් ගැටලුවක් වන්නේ ප්‍රධාන වචන නිර්වචනය කිරීමේදී පැහැදිලි බවක් නොමැති වීමයි. ශ්‍රී ලංකා පනත් කෙටුම්පත යටතේ 'අසත්‍ය ප්‍රකාශය' යන්න නිර්වචනය කර ඇත්තේ 'එහි නිර්මාතෘ විසින් වැරදි හෝ අසත්‍ය යැයි දන්නා හෝ විශ්වාස කරන ප්‍රකාශයක් වන අතර එය විශේෂයෙන් රැවටීමට හෝ නොමඟ යැවීමේ චේතනාවෙන් කරන ලද, නමුත්, සද්භාවයෙන් යුතුව සකස් කරන ලද අවවාදයක්, මතයක් හෝ චෝදනාවක් නොවන,' ලෙසයි. (යම් ප්‍රකාශයක්, එය වැරදි බව හෝ අසත්‍ය බව එය සිදු කරන්නා දන්නා වූ ද නැතහොත් ඒ බවට විශ්වාස කරන්නා වූ ද විශේෂයෙන් ම රැවටීමේ හෝ නොමග යැවීමේ චේතනාවෙන් සිදු කරන්නා වූ ද ප්‍රකාශයක් අදහස් වන නමුත් ඊට සද්භාවයෙන් කරන ලද අනතුරු ඇඟවීමක්, සද්භාවයෙන් පළ කරන ලද මතයක් හෝ සද්භාවයෙන් කරන ලද අධ්‍යාරෝපණයක් ඇතුළත් නොවේ.)

'එහි නිර්මාතෘ විසින් වැරදි බව දන්නා බව හෝ විශ්වාස කිරීම' මනෝමූලික නිර්ණායකයක් වන අතර මෙය අර්ථකථනය කරන්නේ කෙසේද යන්න පැහැදිලි නැත.

සිංගප්පූරු POFMA යටතේ, අසත්‍ය ප්‍රකාශයක් අර්ථ නිරූපණය කරනු ලබන්නේ, ' සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙස, අසත්‍ය හෝ නොමඟ යවන, සහ සාධාරණ පුද්ගලයෙකු විසින් සත්‍ය නියෝජනයක් ලෙස සැලකිය හැකි ප්‍රකාශයක්' ලෙසයි [1]. පනත් කෙටුම්පත් දෙකෙහිම ප්‍රකාශය නිර්වචනය කරනු ලබන්නේ 'කෙටි යෙදුමක් සහ මුලකුරක් ද ඇතුළුව යම් වචනයක්, ඉලක්කමක්, (චලනය වන හෝ අන්‍යාකාරයක් වන) රූපයක්, ශබ්දයක්, සංකේතයක් හෝ වෙනත් නිරූපණයක් හෝ මේ කිසිවක සංකලනයක්' [2] ලෙසයි. නිර්වචන සම්බන්ධයෙන් - ශ්‍රී ලංකා පනත් කෙටුම්පතෙන් තවත් උදාහරණ කිහිපයක් ගතහොත් - 'ආගමික හැඟීම්වලට රිදවීම' (16 වැනි වගන්තිය) සහ 'සාමය උල්ලංඝනය කිරීමේ පරමාර්ථය' (20 වගන්තිය) ඇතිව සාවද්‍ය ප්‍රකාශයක් සිදුකිරීම වැනි වැරදි සඳහා වැරදිකාරීත්වය තීරණය කරන සීමාව පැහැදිලි නැත.

**<u>පාලන යාන්ත්‍රණ හා ක්‍රියාවලි</u>**

පනත් කෙටුම්පතේ (4 වගන්තිය) දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බලතල සහ කාර්යයන් ඉටු කිරීම සඳහා ඔන්ලයින් ආරක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා පනත් කෙටුම්පත විධිවිධාන සපයයි. කොමිෂන් සභාව තොරතුරු තාක්ෂණ, නීතිය, රාජ්‍ය පාලනය, සමාජ සේවා, ජනමාධ්‍ය, විද්‍යා හා තාක්ෂණ හෝ

කළමනාකාරීත්වය යන ක්ෂේත්‍ර එකක හෝ කිහිපයක සුදුසුකම් සහ පළපුරුද්ද ඇති සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එහි සාමාජිකයින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ (5 වන වගන්තිය). කොමිෂන් සභාවේ බලතල පනතේ II කොටසෙහි දක්වා ඇත.

කැපී පෙනෙන කරුණක් වන්නේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නොතීසිවලට එරෙහිව පුද්ගලයන්ට අභියාචනා කළ හැකි පැහැදිලි ක්‍රියාවලියක් පනතෙහි සම්පාදනය කර නොමැති වීමයි. නිදසුනක් වශයෙන්, 'තහනම් ප්‍රකාශයක සන්නිවේදනයෙන් පීඩාවට පත් වූ' පුද්ගලයෙකුට වාචිකව, ලිඛිතව හෝ විද්‍යුත් පෝරමය හරහා කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය. [3] කොමිෂන් සභාවට පැමිණිලි භාර ගැනීම භාරව තොරතුරු නිලධාරින් පත් කළ යුතුය. හැකි නම්, පැමිණිලිකරු විසින් තහනම් ප්‍රකාශය කරන හෝ සන්නිවේදනය කරන පුද්ගලයාට හෝ පුද්ගලයන්ට සහ ඕනෑම අන්තර්ජාල ප්‍රවේශ සේවා සපයන්නෙකුට හෝ අන්තර්ජාල අතරමැදියෙකුට පැමිණිල්ලේ පිටපතක් ලබා දිය යුතුය. [4]

'තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කර ඇති බවට ප්‍රමාණවත් කරුණු තිබේ' යැයි කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් විමර්ශන සිදු කළ යුතු අතර, එම ප්‍රකාශය සංසරණය වීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස අදාළ පුද්ගලයාට දැනුම් දීමක් කළ හැකිය. [5] පුද්ගලයා පැය 24ක් ඇතුළත එම දැනුම්දීම පිළිපැදිය යුතුය. කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද දැන්වීමට එරෙහිව එමගින් බලපෑමට ලක්වූ පුද්ගලයාට අභියාචනා කිරීමට ප්‍රතිපාදන නොමැති අතර, එය සැලකිය යුතු අඩුපාඩුවක් වේ. එමගින් කොමිෂන් සභාවේ බලතල පිළිබඳ සංවරණ හා තුලනයන් සහතික කරන්නේ කෙසේද යන්න පිළිබඳ දක්වා නොමැත.

පුද්ගලයා පැය 24ක් ඇතුළත එම නිවේදනයට අනුකූලව කටයුතු නොකරන්නේ නම්, 'කොමිසමට එවැනි තහනම් ප්‍රකාශයක් (අ) සන්නිවේදනය කර ඇති අන්තර්ජාල ප්‍රවේශ සේවා සපයන්නාට හෝ අන්තර්ජාල අතරමැදියා වෙත (අ) එවැනි තහනම් ප්‍රකාශයකට ශ්‍රී ලංකාව තුළ අවසාන පරිශීලකයින්ට ප්‍රවේශය අක්‍රිය කිරීමට දැන්වීමක් නිකුත් කළ හැකිය; හෝ (ආ) එවැනි මාර්ගගත ස්ථානයකින් එවැනි තහනම් ප්‍රකාශයක් ඉවත් කිරීමට. [6] 'ඕනෑම තහනම් ප්‍රකාශයක' සන්නිවේදනයෙන් පීඩාවට පත් ඕනෑම පුද්ගලයෙකුට එවැනි තොරතුරු සංසරණය වීම වැළැක්වීම සඳහා නියෝගයක් ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය වෙත සෘජුවම අයදුම් කිරීමට ප්‍රතිපාදන ඇත. (27 වගන්තිය)

සිංගප්පූරු පනතේ අභියාචනා සඳහා ප්‍රතිපාදන ඇත. අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කරන්නේ නම් අමාත්‍යවරයාට / නිසි බලධාරියාට ගත හැකි ක්‍රියාමාර්ග පනතේ III කොටසෙහි විස්තර කරයි. ප්‍රකාශය අසත්‍ය බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙස (නිවැරදි කිරීමේ මග පෙන්වීම) හෝ පුද්ගලයාට ප්‍රකාශය සන්නිවේදනය කිරීම නවත්වන ලෙස (සන්නිවේදනය නවත්වන ලෙස නියෝගය) උපදෙස් නිකුත් කළ හැකිය. විධානය ලැබුණු පුද්ගලයාට එම නියෝගයට එරෙහිව මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි නමුත්, එම පුද්ගලයා පළමුව එම නියෝගය වෙනස් කරන හෝ අවලංගු කරන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලුම් කර අමාත්‍යවරයා එම අයදුම්පත ප්‍රතික්ෂේප කළ යුතුව තිබේ. [7]

**<u>සමාජ මාධ්‍ය වේදිකා සපයනු ලබන වෙබ් අඩවි ලියාපදිංචි කිරීම</u>**

අවසාන පරිශීලකයින්ට අන්තර්ජාලය පදනම් කරගත් සන්නිවේදන සේවා සපයන සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් ලවා '... භාවිතා රීති සංග්‍රහ නිකුත් කිරීමට' (අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් සහ ක්‍රියා පටිපාටි සඳහන් කරමින්) අන්තර්ජාල ආරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාවට බලය ඇති බව ශ්‍රී ලංකා පනත් කෙටුම්පතේ සඳහන් වේ. [8] '...මෙම පනත යටතේ සම්පාදනය කරනු ලබන නීති මගින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට, ශ්‍රී ලංකාවේ අවසාන පරිශීලකයින්ට සමාජ මාධ්‍ය වේදිකා සපයන වෙබ් අඩවි' [9] ලියාපදිංචි කළ යුතුය. මේ ආකාරයට ලියාපදිංචිය අනිවාර්ය කිරීමෙන් ඉටු වන්නේ කුමන අරමුණක්ද යන්න පැහැදිලි නැත.

මේ සඳහා වන ක්‍රියාවලිය 53 වැනි වගන්තියේ දක්වා ඇත. කොමිෂන් සභාව විසින් භාවිත රීති සංග්‍රහ නිකුත් කිරීමට පෙර සති දෙකක කාලයක් මහජන අදහස් විමසීම අවශ්‍ය වේ. (වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මහජන අදහස් ලබාගැනීම සඳහා එවැනි කොන්දේසියක් නොමැත.)

**වෙනත් නීති මගින් ආවරණය කරනු ලබන වැරදි**

ශ්‍රී ලංකා පනත් කෙටුම්පතේ ඇති මෙම වැරදිවලින් සමහරක් දැනට පවතින නීතිවලින් අවම වශයෙන් අර්ධ වශයෙන් හෝ ආවරණය වී ඇති බව පෙනේ. නිදසුනක් වශයෙන්, ආගමික හැඟීම් රිදවන වැරදි සම්බන්ධයෙන්, සමාන පදනමකින් ආවරණය වන නීති ඇත. මෙම නීති ක්‍රියාත්මක කිරීම පවා දැනටමත් බෙහෙවින් ගැටලුකාරී වී ඇත. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 2(1)(h) වගන්තිය [10] මගින් දැනටමත් වචන, සංඥා, දෘශ්‍ය නිරූපණයන් හෝ වෙනත් ආකාරයකින් 'ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ආගමික හෝ වාර්ගික අසමගිය හෝ අයහපත් හැඟීම් ඇති කිරීම' හෝ 'විවිධ ප්‍රජාවන් හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර අයහපත් හැඟීම් හෝ සතුරුකම් ඇති කිරීම' වරදක් බවට පත් කරයි.

දණ්ඩ නීති සංග්‍රහයේ 291A වගන්තිය අනුව, හිතාමතාම ආගමික හැඟීම්වලට රිදවීමේ අරමුණින් වචන ප්‍රකාශ කිරීම වසරක් දක්වා සිරදඬුවමක් හෝ දඩයක් හෝ දෙකම සමඟ දඬුවම් ලැබිය හැකි වරදක් වේ. [11] ICCPR පනතේ 3 වන වගන්තිය යුද්ධය ප්‍රචාරය කිරීම හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටීම අපරාධ බවට පත් කරයි (කෙසේ වෙතත් මෙහි වැරදි සඳහා සීමාව හුදෙක් 'ආගමික හැඟීම් රිදවීමේ චේතනාවට' වඩා වැඩි ය. වෙනස් කොට සැලකීම, සතුරුකම සහ ප්‍රචණ්ඩත්වය සඳහා උසිගැන්වීමක් ද තිබිය යුතුය'). මෑත වසරවල මෙම කොටස වැරදි ලෙස භාවිතා කිරීම දැනටමත් විවේචනයට ලක්ව ඇත. [12][13]

**ඉදිරියට යාම**

පනත් කෙටුම්පතේ අනාගත අනුවාද සකස් කිරීමේදී ප්‍රතිපත්ති සම්පාදකයින් මෙම ගැටලුකාරී කරුණු සලකා බලනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහත සාකච්ඡා කළ පරිදි, මෙම පනත් කෙටුම්පත සිංගප්පූරු පනත ආදර්ශයට ගෙන ඇති බව පෙනෙන්නට තිබුණද, බොහෝ පැතිවලින් එය ඉක්මවා යයි. සිංගප්පූරු පනත පවා හඳුන්වා දුන්නේ මහජන අදහස් විමසීමේ පුළුල් ක්‍රියාවලියකින් පසුව බව සඳහන් කළ යුතුය. පුද්ගලයන්ට සහ සංවිධානවලට සාක්ෂි දීමට ආරාධනා කරන ලද මහජන සාක්ෂි විමසීම් පැවැත්විණි.[14] ශ්‍රී ලංකාව තුළ අවම වශයෙන් එවැනි ක්‍රියාවලියක් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

[1] POFMA වගන්තිය 2 (2)
[2] වගන්තිය 56, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[3] වගන්තිය 26 (1) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[4] වගන්තිය 26 (3)(b) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[5] වගන්තියස 26 (5), 26 (6) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[6] වගන්තිය 26 (7) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[7] වගන්තිය 17, POFMA
[8] වගන්තිය 11 (j) සහ වගන්තිය 53 මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[9] වගන්තිය 11 (k) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
[10] වගන්තිය 2(1)(h) ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA), 1979 අංක 48
[11] වගන්තිය 291A දණ්ඩ නීති සංග්‍රහය

[12] https://www.sundaytimes.lk/230709/columns/on-courageous-judicial-reasoning-and-sri-lankas-iccpr-act-524888.html\

[13] https://www.newswire.lk/wp-content/uploads/2023/07/%E0%B6%91%E0%B6%A0%E0%B7%8A.%E0%B7%83%E0%B7%92.%E0%B6%8A.%E0%B6%B6%E0%B7%93.%E0%B6%92.-1335-23.pdf

[14]https://web.archive.org/web/20181015114522/https://www.channelnewsasia.com/news/singapore/select-committee-on-deliberate-online-falsehoods-79-hearings-10029818